**හලාවත ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජූලි 26 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට හලාවත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

| | <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|---|
| (i) | සභා කාර්යාලීය ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධයෙන් පළකළ පුවත්පත් දැන්වීම් සඳහා වැය වූ රු.73,312 ක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | ගණුදෙනු නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සම්බන්ධ පුවත්පත් දැන්වීම සඳහා වැයවූ රු.73,312 ක මුදල ණයහිමි ගිණුමේ ප්‍රාග්ධන වැය ලෙස ගිණුම්ගත කර තිබූ අතර, ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කරන ලදී. |
| ( (ii) ආ ) නො සැ ස | කෘෂි මාර්ග සංවර්ධනය සඳහා කෘෂිකර්ම හා ගොවිජන සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු.200,000 ක මුදල රු.2,000,000 ක් ලෙස රු.1,800,000 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට නිවැරදි කිරීමට පියවර ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි. |
| දු (iii) ණු ගි ණු ම | රු.1,513,831 ක් වැයකර 2017 වර්ෂයේ ඉදිකර තිබූ ගෝඝාතකාගාරය ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | ගණුදෙනු නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු වේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට නිවැරදි කිරීමට පියවර ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි. |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ගිණුම් විෂයයන් 08 ක උපලේඛන/ උපයෝගී පොත් අනුව ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන අනුව වූ ශේෂයන් අතර නොසැසඳීම්වල එකතුව රු.16,630,907 ක් විය. | අදාළ ශේෂ වල වෙනස්කම් සසඳා මූල්‍ය ප්‍රකාශන නිවැරදි කිරීමට කටයුතු කල යුතු වේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(i) ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබි යුතු ගිණුම් 09 ක ශේෂ එකතු රු.170,128,511 ක් වූ අතර, ඉන් වර් තුනක කාලයක් ඉක්මවූ ශේ එකතුව රු.31,075,622 ක් විය. | ලැබිය යුතු ශේෂයන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | දැනටමත් වරිපනම් හිඟ, මුද්දර ගාස්තු සහ ප්‍රාග්ධන ආධාර කොටසක් අයකරගෙන ඇත. ඉදිරියේදී අනෙකුත් ලැබිය යුතු ගිණුම් අයකර ගැනීමට කටයුතු කරමි. |

**(ii) ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් 05 ක ශේෂවල එකතුව රු.69,887,777 ක් වූ අතර ඉන් වසර 03ක් ඉක්මවූ ශේෂය රු.229,585 ක් විය. | ගෙවිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට ණයහිමියන් නිරවුල් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**(ඈ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එකතු වටිනාකම රු.196,588,536 ක් වූ ගිණුම් විෂයයන් 02 කට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් කල යුතු වේ. | 2019 වර්ෂයේදී ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩලයක් පත්කර සමීක්ෂණ කිරීමෙන් පසු ස්ථාවර වත්කම් ලේඛනය , සමීක්ෂණ වාර්තා හා වත්කම් සඳහා උපලේඛන නිවැරදිව සකස් කර ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලටඅනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති | | | |
| (i) 217 රීතිය | සභාව විසින් ප්‍රයෝජනයට ගන්නා හා සභාව විසින් පදිංචියට ගන්නා ලද සියළු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව ලේඛනයක් යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගත යුතු වේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව ලේඛනයක් යාවත්කාලීන කර, ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ii) 218 රීතිය | සියළු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව සෑම වර්ෂයකට වරක් පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව වාර්ෂිකව සමීක්ෂණ සිදුකළ යුතු වේ. | සෑම වර්ෂයකම ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව සමීක්ෂණ මණ්ඩලයක් පත්කර පරීක්ෂාවක් සිදුකර ගැනීමට කටයුතු කරන බවද කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (i) 396(ඇ) වගන්තිය | නිකුත් කර මාස 06 ඉකුත් වූ චෙක්පත් 10 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉදිරියේදී ඒ සඳහා ගැලපීම් සිදුකරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ii) 571 වගන්තිය | වසර 02 ක් ඉක්මවූ තැන්පතු 148 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | වර්ෂ 02 ඉක්මවූ සියළුම තැන්පත් ලැයිස්තුගත කර, ආපසු ලබාගැනීම සඳහා හැකිතාක් දුරට විමසා බැලීමෙන් පසු රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.47,388,780 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.43,296,658 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ගොඩනැගිලි සංවර්ධන අරමුදල සහ ජල හා සනීපාරක්ෂක අරමුදල නමින් ඉතිරිකිරීමේ ගිණුම් 02 ක් පවත්වාගෙන යන අතර ඒවායේ මුදල් වැඩි ප්‍රතිලාභයක් ලැබෙන පරිදි ආයෝජන ගිණුමකට මාරු නොකොට ඉතිරි කිරීමේ ගිණුම්වල රඳවා තිබුණි. එම ගිණුම් වල 2018 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.994,031 ක් විය. | ඉතිරි කිරීමේ ගිණුමේ මුදල් වැඩි ප්‍රතිලාභ ඇතිවන පරිදි ආයෝජනය කළ යුතු වේ. | 2019 වර්ෂයේ මහ සභා අනුමැතිය ගෙන ආයෝජන ගිණුමකට මාරු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට සහ ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්,රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. '000 | රු. '000 | රු '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 5,052 | 4,814 | 4,510 | 2,414 | 4,717 | 4,833 | 4,841 | 2,414 |
| කුලී | 10,235 | 12,000 | 11,857 | 714 | 12,410 | 12,367 | 12,332 | 861 |
| බලපත්‍ර ගාස්තු | 2,122 | 3,583 | 3,583 | - | 2,897 | 4,074 | 4,074 | - |
| වෙනත් ආදායම් | 67,276 | 69,663 | 66,609 | 126,943 | 133,775 | 74,932 | 44,028 | 154,402 |
| එකතුව | 84,685 | 90,060 | 86,559 | 130,071 | 153,799 | 96,206 | 65,275 | 157,677 |

- ❖ රැස් කළ ආදායම තුල සමාලෝචිත වර්ෂයට බිල් කළ ආදායමෙන් කළ එකතු කිරීම් සහ පසුගිය වර්ෂවල හිඟ ආදායමෙන් කළ එකතු කිරීම් ඇතුළත්ව තිබේ.

### 2.3.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට මුළු බිල්කළ ආදායම රු.90,060,827 ක් හා සමාලෝචිත වර්ෂය ආරම්භයේ හිඟය රු.157,676,854ක් වූ අතර එයින් රු.86,557,944ක් වර්ෂය තුල රැස්කර තිබුණි. ඒ අනුව සමස්ත ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 35ක් පමණ විය. | වාර්ෂිකව බිල්කළ ආදායම වර්ෂය තුල අයකර ගත යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

### 2.3.3 වරිපනම් හා බදු

----------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා බිල්කළ වරිපනම් රු.4,684,624න් වර්ෂය තුලදී රු.3,244,850ක් රැස්කර තිබුණු අතර එය බිල්කළ වටිනාකමින් සියයට 69 ක් විය. සමාලෝචිත වර්ෂය ආරම්භයේ හිඟ හිටි වරිපනම් රු.2,179,075 න් වර්ෂය තුලදී රු.1,266,344 ක් රැස්කර තිබුණු අතර එය වර්ෂය ආරම්භයේ හිඟ වටිනාකමින් සියයට 58 ක ප්‍රමාණයක් විය. | වර්ෂයට බිල්කළ වරිපනම් වර්ෂය තුල අයකිරීමට කටයුතු කළ යුතුවේ. | 2018 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු හිඟයෙන් රු.408,964ක් මේ වනවිට රැස්කර ඇති අතර ඉතිරි මුදල 2019 වර්ෂයේදී රැස්කිරීමට බලාපොරොත්තු වේ. |

### 2.3.4 කුලී

--------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2012 වර්ෂයට පෙර සිට පැවත එන රු.416,398 ක ටෙන්ඩර් කුලී මුදල් හා 2014 වර්ෂයේ සිට පැවත එන රු.181,347 ක විශ්‍රාම ශාලා කුලී රැස්කළ යුතුව තිබුණි. | හිඟ හිටි ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර ඉදිරියේදී මෙවැනි තත්ත්ව අවම කර ගැනීම සඳහා බදු ගිවිසුම් වලට එළඹිය යුතු වේ. | 2014 වර්ෂයේ සිට පැවත එන රු.181,347 ක මුදලට මේ වනවිට එන්තරවාසි යවා එයටද පිළිතුරු නොමැති බැවින් නඩු ගොනු කිරීමට නීතීඥවරයෙකු වෙත භාරදී ඇත. 2012 වර්ෂයේ සිට පවතින රු.416,398 ක මුදල මස්කඩ කිහිපයක හිඟ බැවින් ඒවා සඳහා නීත්‍යානුකූලව ක්‍රියා කළ නොහැකි බැවින් කපා හැරීමට යෝජනාවක් මහ සභාව විසින් සම්මත කර ඇත. |

**2.3.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.37,309,402 ක් හා මුද්දර ගාස්තු රු.117,092,284 ක් විය. | කඩිනමින් උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගැනීමට පියවර ගත යුතු වේ. | උසාවි දඩ රු.25,800,000 ක් හා මුද්දර ගාස්තු රු.400,000 ක් අයකර ඇත. ඉතිරි මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්ය සාධනය** --

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකලයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු නොකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවක් විසින් අතුරු ව්‍යවස්ථා පනවා අදාල සේවාවන් මහජනතාව වෙනුවෙන් ඉටුකළ යුතුව ඇතත් සභාව සතු පාරවල්, මංමාවත්, සහ ඉඩම් හා දේපල කළමනාකරණය හා නඩත්තුව සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අදාල අතුරු ව්‍යවස්ථා පනවාගෙන මහජන සුහසාධනය වෙනුවෙන් සේවා සැපයිය යුතු වේ. | ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**(ආ) ඉටු නොකළ කාර්යයන්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික අයවැය මගින් රු.13,370,000 ක ප්‍රතිපාදන සළසා තිබුණු කර්තව්‍යයන් 36 ක් සමාලෝචිත වර්ෂය තුල ඉටුකර නොතිබුණි. | වාර්ෂික අයවැය ලේඛන සකස් කිරීමේදී සත්‍ය වශයෙන් දැරිය යුතු හා අත්‍යාවශ්‍යතාවයන් හඳුනාගෙන කටයුතු කල යුතු වේ. | විගණනය පෙන්වා දුන් පරිදි එම කාර්යයන් සඳහා ප්‍රතිපාදන සළසා ඇතත් අදාල කර්තව්‍යයන් ඉටු කළ නොහැකි විය. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව මගින් කසළ ප්‍රතිචක්‍රීකරණය සඳහා කාබනික පොහොර නිෂ්පාදන ව්‍යාපෘතියක් පවත්වා ගෙන ගියද අවසානයේ ඉතිරි කසළ බැහැරලන ස්ථානයක් සභාව සතුව නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා සැළසුම් කර තිබුණු නොදිරන කසළ මිලදී ගැනීමේ හා අලෙවි කිරීමේ ව්‍යාපෘතිය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය යටතේ පොලිතීන් භාවිතය අවම කිරීම හා සභා බල ප්‍රදේශයේ ප්‍රජාව වෙත නැවත භාවිතා කළ හැකි මළු බෙදාදීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | කසළ බැහැර කිරීමේ ස්ථිර ක්‍රමවේදයක් සොයා ගත යුතු වේ. | ඉදිරියේදී කසල බැහැර කිරීම සඳහා ස්ථිර ක්‍රමවේදයක් සොයාගැනීම සඳහා කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**(ඈ) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| එක්සත් ජාතීන්ගේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" පිළිබඳව සභාව දැනුවත් වී තිබුණු අතර හදිසි ආපදාවක් සිදුවන ඕනෑම අවස්ථාවක හැකි ඉක්මනින් ජනතාව වෙත සහන සැලසීම හා බල ප්‍රදේශයේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ඇතිකිරීම යනුවෙන් තිරසර සංවර්ධන ඉලක්ක 02 ක් හඳුනාගෙන සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාවට නංවා තිබුණි. | පළාත් පාලන ආයතන වලට අදාළව ඉටු කල හැකි තිරසර සංවර්ධන අරමුණු හඳුනාගෙන ඒවා ඉටු කිරීමට කටයුතු කළයුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) පුරනැගුම ව්‍යාපෘතිය මගින් ඉදි කර තිබුණු මාදම්පේ නව බස් නැවතුම්පලෙහි කඩ කාමර 05ක් සඳහා 2017 ජනවාරි 01 දින සිට 2019 දෙසැම්බර් 31 දින දක්වා කාලයට බදු මුදල් නිසි පරිදි ගෙවා තිබුණද 2019 මැයි 15 දින වන විටත් කඩ කාමර විවෘත කර නොතිබුණි. | කඩ කාමර බදු දීමට හා විවෘත කිරීමට කටයුතු කළ යුතු වේ. | මේ වන විට එක් කඩ කාමරයක් සභාව වෙත භාරදී ඇති අතර, අනෙකුත් කඩ කාමර විවෘත කරන ලෙස මින් ඉහතද දැනුම් දී ඇත. මේ වන විට ඉතිරි කඩ කාමර විවෘත කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 වර්ෂයේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම වෙනුවෙන් 2017 වර්ෂයේ ලැබී තිබුණු රු.27,000 ක් වටිනා මුදල් ඇණවුම් 39 ක් සහ ඊට පෙර වර්ෂවල ලැබී තිබුණු රු.2,500 ක් වටිනා මුදල් ඇණවුම් 2019 අප්‍රේල් 30 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | උපලබ්ධි වී නොතිබුණු මුදල් ඇණවුම් සම්බන්ධයෙන් කඩිනමින් ක්‍රියා මාර්ග ගත යුතු වේ. | මුදල් ඇණවුම්වලට අදාලව නිකුත් කරන ලද ලදුපත් තිබුණද එම මුදල් බැංකුවට ප්‍රේෂණය වී නොමැත. අදාල සැපයුම්කරුවන්ගේ විස්තර ලබාගෙන මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදුකරමි. |
| (ඇ) | වර්ෂ 1997 සිට 2016 දක්වා කාලය තුල සහා බල ප්‍රදේශයේ ඉඩම් කට්ටි කර විකිණීමේදී පොදු කටයුතු සඳහා සභාවට වෙන්කර තිබුණු ඉඩම් කොටස් 11ක ඔප්පු සභාවට පවරාගෙන නොතිබුණි. තවද මෙම ඉඩම් කොටස් මායිම් යොදා ආරක්ෂා කර ගැනීමේ වැඩ පිළිවෙලක් අනුගමනය කර නොතිබුණි. | ඉඩම් කට්ටි කිරීමේදී පොදු කටයුතු සඳහා සභාවට වෙන්කර ඇති ඉඩම් කොටස් අදාල ඔප්පු මගින් පවරා ගැනීමටත් එම ඉඩම් මායිම් යොදා ආරක්ෂා කර ගැනීමටත් ක්‍රියා කළ යුතු වේ. | 1997 සිට 2016 දක්වා කාලය තුල සභා බල ප්‍රදේශයේ ඉඩම් කට්ටි කර විකුණූ ඉඩම්වලින් සභාවට පොදු කටයුතු සඳහා වෙන්කල ඉඩම් කොටස්වලට අදාල ඔප්පු ගොනුවල පවතින තොරතුරු උපයෝගී කර ගනිමින් ඉඩම් කොටස්වල පුද්ගලයින් වෙත ලිපි යවා ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ඇ) | 2005 වර්ෂයේදී කොටස් කර අලෙවිකර තිබුණු ඉඩම් 04 කින් පොදු කටයුතු සඳහා ඉඩම් කොටස් සභාවට ඔප්පු මගින් පවරාගෙන නොතිබුණු අතර පොදු කටයුතු සඳහා සභාවට පැවරිය යුතු ඉඩම් කොටස් හඳුනාගෙනද නොතිබුණි. | ඉඩම් කොටස් කර විකිණීමේදී පොදු කටයුතු සඳහා සභාවට පැවරිය යුතු ඉඩම් කොටස් හඳුනාගෙන පවරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2005 වර්ෂයේදී ඉඩම් කොටස් කර අලෙවිකර තිබූ ඉඩම්වල තොරතුරු ගොනු තුල නොපවතින අතර ඉදිරියේදී නිවැරදිව සොයා බලා කටයුතු කරන බව තවදුරටත් කාරුණිකව දන්වා සිටිමි. |
| (ඉ) | හලාවත ඉණිගොඩවෙල පාසල් භූමිය පැවරීම සඳහා හලාවත ප්‍රාදේශීය ලේකම් වෙත 2000 වර්ෂයේදී ලබාදී තිබුණු රු.25,000ක අත්තිකාරම් මුදලක් 2019 මැයි 15 දින වන විටත් පියවීම් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අත්තිකාරම් මුදල නිසි පරිදි පියවීම් කල යුතු වේ. | සභාව විසින් ඉනිගොඩවෙල මලියදේව විදුහල් භූමිය ප්‍රාදේශිය සභාවට පවරාගැනීම සඳහා හලාවත ප්‍රාදේශීය ලේකම් වෙත ලබාදෙන ලද රු.25,000ක අත්තිකාරම් මුදල පළාත් සභා ආදායමට බැර කළ බවට ලිපියකින් දන්වා එවා ඇත. ඒ අනුව එම අත්තිකාරම් මුදල මහ සභා සම්මතයකින් නිදහස් කිරීමට පියවර ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2002 සිට 2011 දක්වා කාල වකවානු තුල වත්කම් බදුදීම වෙනුවෙන් අයවිය යුතු රු.416,398ක බදු මුදලක් අදාල කාල සීමා තුල අයකර ගැනීමට පියවර නොගැනීම මත අයකර ගැනීමේ අවිනිශ්චිතභාවයක් පැවතුණි. | හිඟ බදු මුදල් කාලීනව අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2002 සිට 2011 දක්වා කාල වකවානුවේදී ටෙන්ඩර් කරන ලද කඩ 08 ක් සඳහා රු.416,308 ක මුදලක් අයවීමට ඇත. ඒ සඳහා නඩු ගොනු කිරීමට කාලාවරෝදය යටතේ නොහැකි වී ඇත. එසේම අදාල කඩ සමඟ ඇතිකරගන්නා ලද ගිවිසුම් සොයාගැනීමේ හැකියාවක් නොමැත. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

**(අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ද්වීතියික හා ප්‍රාථමික ශ්‍රේණිවලට අයත් තනතුරු 27ක පුරප්පාඩු පවතින අතර තාක්ෂණ නිලධාරි, වැඩ අධිකාරි, ආදායම් පරීක්ෂක වැනි සභාවේ ප්‍රධාන තනතුරුද ඒ අතර විය. තවද ද්වීතියික හා ප්‍රාථමික ශ්‍රේණිවල තනතුරු 02ක අතිරික්ත කාර්ය මණ්ඩලය 11 ක් විය. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සියළුම පුරප්පාඩු සම්බන්ධයෙන් අනුමැතිය ලබාගැනීමට ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඉදිරියේදී එම තනතුරු සඳහා බඳවාගැනීම් වෙනුවෙන් අදාල රාජකාරි කටයුතු සිදු කරමින් පවතී. |

**(ආ) සේවක ණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට අය නොවන සේවක ණය ශේෂය රු.464,957 ක් වූ අතර බොහෝ ණය ශේෂ පිළිබඳ තොරතුරු සභාව සතුව නොතිබුණි. හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | හිඟ සේවක ණය අයකර ගැනීමටත් හිඟ ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් පිළියෙල කිරීමටත් කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන විට සේවක ණය ලේඛනය නිවැරදිව පිළියෙල කර කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවට අයත් සියළු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව යාවත්කාලීන ලේඛනයක් සභාව සතුව නොපවතින අතර ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව විධිමත් සමීක්ෂණයක්ද කිසිදු වර්ෂයක සිදුකර නොතිබුණි. 2018 මූල්‍ය ප්‍රකාශන අනුව ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම රු.185,364,898 ක් වූ අතර වටිනාකම රු.179,590,325ක් සඳහා පමණක් උපලේඛන ඉදිරිපත් කර තිබුණි. සභාවට අයත් ඉඩම් නිශ්චිතව හඳුනාගැනීම සඳහා ඉඩම් සමීක්ෂණ කටයුතු සිදු කිරීමට 2017 වර්ෂයේ රු.400,000 ක් හා 2018 වර්ෂයේ රු.200,000ක් අයවැය මගින් වෙන්කර තිබුණද කිසිදු වර්ෂයක අදාල කාර්යය සිදුකර නොතිබුණු අතර එය වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට හා අයවැයට පමණක් සීමාකර තිබුණි. | සභාවට අයත් ඉඩම් නිශ්චිතව හඳුනා ගැනීම සඳහා ක්‍රියා මාර්ග ගත යුතු අතර ඉඩම් සමීක්ෂණය සිදු කිරීමට කටයුතු කල යුතු වේ. | 2019 වර්ෂයේ ඉඩම් හා ගොඩනැගිලි පරීක්ෂා කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩලයක් පත්කර ඉඩම් නිශ්චිතව හඳුනාගැනීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි |

## 3.6 ප්‍රසම්පාදනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමග ප්‍රසම්පාදන සැලැස්ම අනුගත නොවූ ඇස්තමේන්තු වටිනාකම රු.1,800,000 ක් වූ ක්‍රියාකාරකම් 05 ක් පැවතුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සමග අනුගත වන පරිදි ප්‍රසම්පාදන සැලැස්ම සකස් කල යුතු වේ. | 2019 වර්ෂයේදී ක්‍රියාකාරී සැලැසුම සමඟ ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

## 4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---

### 4.1 අයවැය පාලනය

---

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වැය විෂයයන් 60 ක් සඳහා ප්‍රතිපාදිත රු.7,297,000 ක් සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණු අතර ඒවායින් බොහොමයක් සභා බල ප්‍රදේශයේ සුභසාධනය, ආදායම් ප්‍රවර්ධනය, පුස්තකාල සේවා හා පෙර පාසල් කටයුතු සම්බන්ධ ඒවා විය. | වාර්ෂික අයවැය මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ කාර්යයන් ඉටු කල යුතු වේ. | 2018 වර්ෂයේ අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන ලබාදී සංවර්ධන කටයුතු බොහොමයක් ඉටුකිරීමට සැලසුම් කළද, අවශ්‍ය මුදල් ප්‍රතිපාදන නොලැබූ හෙයින් ඉටු කිරීමට නොහැකි වූ බව දන්වමි. |
| (ආ) | පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා, සෞඛ්‍ය සේවා, භෞතික සැලසුම්, මංමාවත්, ඉඩම් ගොඩනැගිලි හා සුභසාධක සේවා පහසුකම් යන වැඩසටහන්වල වැය විෂයයන් 25කට අදාල රු.16,855,000 ක් වූ ප්‍රතිපාදනවලින් රු.14,730,270 ක් වියදම් නොකර ඉතිරි වී තිබුණු අතර එම එක් එක් වැය විෂයය යටතේ ප්‍රතිපාදන සියයට 50 සිට සියයට 99 දක්වා පරාසයක් තුල ඉතිරිවී තිබුණි. | වාර්ෂික අයවැය මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ කාර්යයන් ඉටු කල යුතු වේ. | 2018 වර්ෂයේ අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදන ලබාදී සංවර්ධන කටයුතු බොහොමයක් ඉටුකිරීමට සැලසුම් කළද, අවශ්‍ය මුදල් ප්‍රතිපාදන නොලැබූ හෙයින් ඉටු කිරීමට නොහැකි වූ බව දන්වමි. |

### 4.2 අභ්‍යන්තර විගණනය

---

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා විගණන සැලැස්මක් පිළියෙල කර තිබුණද කොන්ත්‍රාත් සම්බන්ධයෙන් විගණනයක් සැළසුම්කර වර්ෂය තුල සිදුකර නොතිබුණි. අභ්‍යන්තර විගණන වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | කොන්ත්‍රාත් පිළිබඳ අභ්‍යන්තර විගණනයක් වාර්ෂිකව සිදු කල යුතු වේ. | අභ්‍යන්තර විගණන සැලැස්ම සඳහා කොන්ත්‍රාත් පිළිබඳව විගණනයක් 2018 වර්ෂයේ ඇතුළත් කර නොමැති වුවද 2019 වර්ෂයේ කොන්ත්‍රාත් පිළිබඳව විගණනයක් සිදු කරනු ලබන බවට දන්වා සිටිමි. |